# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 10

## හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - ව්‍යුහගත ප්‍රශ්න

01) මිහිර කුමාර හා රසික හවුල් ව්‍යාපාරය පහත තොරතුරු සපයා ඇත.

- ★ ප්‍රාග්ධන පොළී 5%
- ★ හවුල් කරුවන්ගේ මාසික වේතන රු.5,000

31/12/2020 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර(රු'000) | බැර(රු'000) |
|---|---:|---:|
| ආරම්භක තොගය 01/01/2020 | 12,000 | |
| ගැනුම් | 240,000 | |
| වෙළඳ ලැබිය යුතු දේ | 30,000 | |
| ගැනිලි -මිහිර | 12,000 | |
| - කුමාර | 6,000 | |
| - රසික | 3,000 | |
| වේතන | 12,000 | |
| ප්‍රචාරන වියදම් | 3,000 | |
| මෝටර් රථ - පිරිවැයට | 100,000 | |
| ලී බඩු - පිරිවැයට | 90,000 | |
| ලිපි ද්‍රව්‍ය | 2,000 | |
| 10% ආයෝජන | 20,000 | |
| මුදල් | 12,200 | |
| ඉඩම් - පිරිවැයට | 300,000 | |
| ප්‍රාග්ධන ශේෂයන් - මිහිර | | 150,000 |
| - කුමාර | | 120,000 |
| - රසික | | 100,000 |
| ජංගම ගිණුම් ශේෂ 01/01/2020 | | |
| - රසික<br>- මිහිර | 2,000 | <br>5,000 |
| - කුමාර | | 3,000 |
| වෙළඳ ගෙවිය යුතු දේ | | 15,000 |
| අඩමාන ණය සඳහා ඉඩ හැරීම 01/01/2020 | | 1,200 |
| ණය ශේෂය – රසික | | 10,000 |
| 01/01/2020 දිනට ක්ෂය වෙන්කිරීම | | |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | | |
|---|---|---|
| - මෝටර් රථ | | 30,000 |
| - ලී බඩු | | 20,000 |
| විකුණුම් | | 390,000 |
| | 844,200 | 844,200 |

අමතර තොරතුරු

I. 31/12/2020 දිනට තොගය රු.23,000 ක් වේ.

II. රු.12 000 ක විකුණුම් මිල වූ තොගයක් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවා ඇති අතර ඒවා ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත. මෙම තොගයෙන් 50% ක තොගයක් ඉතිරි වී ඇති අතර ආපසු එවීමේ කාලසීමාව ඉකුත් වී නොමැත. මෙම තොගයේ විකුණුම් මිල පිරිවැයට 25% ලාභයක් ලැබෙන සේ තීරණය කර ඇත.

III. 2020/12/31 දිනට ඉතිරි ලිපි ද්‍රව්‍ය රු. 500 කි.

IV. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ අලාභ කපා හැරීම් රු. 500ක් වේ. අපේක්ෂිත අඩමාන ණය සඳහා ඉඩහැරීම ඉතිරි ශේෂයෙන් 5% කි.

V. හවුල් කරුවන්ගේ භාණ්ඩ ගැනිලි – මිහිර රු.5,000 ක් හා, කුමාර රු.4,000 කි. මේ සම්බන්ධයෙන් කිසිවක් පොත්වල වාර්තා කර නැත.

VI. රු.15,000 ක් වටිනා ලී බඩු 2020/06/30 දින රු.10,000 කට විකුණා ඇත. විකිණීමෙන් ලද මුදල මුදල් ගිණුම හර කර විකුණුම් ගිණුම බැර කිරිම හැර වෙනත් කිසිදු සටහනක් මේ සම්බන්ධව තබා නැත. මෙම ලී බඩු මිල දී ගෙන ඇත්තේ 2017/01/01 දිනයි.

VII. උපචිත විගණන වියදම් රු. 2,000 කි.

VIII. දේපළ පිරියත උපකරණ පිරිවැයට 10% ක් ක්ෂය කළ යුතු වේ.

අවශ්‍ය වන්නේ

1. 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා ලාභ අලාභ විසර්ජන ප්‍රකාශය
2. හවුල්කරුවන්ගේ ජංගම හා ප්‍රාග්ධන ගිණුම්
3. 2020/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

02) අරුණ සහ වරුණ ලාභ අලාභ 3:2 අනුපාතයට බෙදාගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට කමල් 2020/04/01 දින ඇතුලත් විය. ඔවුන්ගේ නව හවුල් ගිවිසුම පහත පරිදි වේ.

- ලාභ අලාභ බෙදා ගැනීමේ නව අනුපාතය අරුණ, වරුණ සහ කමල් අතර 5:3:2
- ප්‍රාග්ධන ශේෂ මත පොළී 10%
- ශුද්ධ ලාභය මත කමල් ට ගෙවීමට එකඟ වූ කොමිස් ප්‍රතිශතය 10%
- වරුණ විසින් ව්‍යාපාරයට සපයා ඇති ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු. 2,000
- හවුල් කරුවන්ගේ වේතන අරුණ - රු.3,000 (මාසික) වරුණ - රු.5,000 (මාසික)

2021/3/31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පත්‍රය

| | හර (රු'000) | බැර (රු'000) |
|---|---|---|
| ලී බඩු උපකරණ | 4,000 | |
| මෝටර් රථ | 6,000 | |
| ක්ෂය වෙන් කිරීම් | | |
| - ලී බඩු උපකරණ | | 1,200 |
| - මෝටර් රථ | | 1,800 |
| තොගය 2020/04/01 දිනට | 800 | |
| ගැනුම් | 2,600 | |
| ගැනුම් වියදම් | 200 | |
| විකුණුම් | | 6,200 |
| බෙදාහැරීම් වියදම් | 400 | |
| පරිපාලන වියදම් | 841 | |
| 12% බැංකු ණය | | 1,000 |
| බැංකු ණය පොළී | 100 | |
| වෙළඳ ලැබිය යුතු දේ | 400 | |
| වෙළඳ ගෙවිය යුතු දේ | | 300 |
| අඩමාන ණය වෙන් කිරීම් | | 20 |
| ප්‍රාග්ධන ශේෂ | | |
| - අරුණ | | 2,000 |
| - වරුණ | | 1,800 |
| - කමල් | | 800 |
| ජංගම ගිණුම් ශේෂ | | |
| - අරුණ | | 200 |
| - වරුණ | | 100 |
| ණය ශේෂය - කමල් | | 500 |
| බැංකු ශේෂය | 759 | |
| බොල් ණය | 20 | |
| ණය ශේෂය - වරුණ | | 200 |
| | 16,120 | 16,120 |

අමතර තොරතුරු

I. තොගය 2021/03/31 දිනට රු.900,000 ක් වේ.

II. සියලුම ස්ථාවර වත්කම් 10% ක් පිරිවැය මත ක්ෂය කළ යුතු වේ.

III. උපචිත විදුලිය රු.20,000කි. ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම රු.10,000කි.

IV. කපා හැරිය යුතු බොල් ණය රු.10,000. අඩමාන ණය වෙන් කිරීම 10%.

V. කමල් විසින් ප්‍රාග්ධනය ලෙස ගෙන ආ මුදල නිවැරදිව සටහන් කර ඇත.

VI. කමල්ගේ ඇතුලත් වීම මත හවුල් ව්‍යාපාරයේ කිර්තිනාමය රු.1,000,000 ක් ලෙස අගය කර ඇත. එය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපිය යුතුවේ.

VII. හවුල් කරුවන්ගේ මුදල් ගැනිලි අරුණ- රු. 50,000, වරුණ - රු. 40,000 , කමල් රු. 30,000කි. මේ සම්බන්ධව කිසිවක් පොත් වල වාර් තා කර නැත.

VIII. කමල්ගේ ණය මුදල ඔහු හවුල් ව්‍යාපාරයට ඇතුලත් වූ දිනයේ දී ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීමට තීරණය කරන ලදී.

අවශ්‍ය වන්නේ,

1) 2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සහ ලාභ අලාභ විසර්ජන ප්‍රකාශනය
2) හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්
3) 2021/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ඒකකය

03) රංග , ජීව සහ සුජීව 5:3:2 ලාභ අලාභ බෙදා ගනිමින් ගිය හවුල් ව්‍යාපාරයෙන් රංග 2020/12/31 දින විශ්‍රාම ගන්නා ලදි. ඔවුන්ගේ හවුල් ගිවිසුමේ ඇතුලත් කොන්දේසි පහත පරිදි විය.

- රංගට මාසිකව රු. 1,000 වේතනයක් ගෙවිය යුතුවේ.
- සුජීවට ශුද්ධ ලාභයෙන් 10% ක කොමිස් මුදලක් ගෙවිය යුතුවේ.

2020/12/31 දිනට ශේෂ පිරික්සුම

| | හර | බැර |
|---|---|---|
| මෝටර් රථ | 180,000 | |
| කාර්යාල උපකරණ | 195,000 | |
| ගෘහ භාණ්ඩ | 82,000 | |
| තොගය 2020/01/01 දිනට | 19,700 | |
| ගැනුම් | 134,400 | |
| විකුණුම් | | 448,000 |
| ගෙන ඒමේ කුලී | 6,900 | |
| වෙළඳ ලැබිය යුතු දේ | 43,500 | |
| වෙළඳ ගෙවිය යුතු දේ | | 28,750 |
| විදුලිය | 8,700 | |
| කුලී | 14,000 | |
| වේතන | 36,900 | |
| ලිපි ද්‍රව්‍ය | 11,300 | |
| බොල් ණය | 2,000 | |
| දුන් වට්ටම් | 3,600 | |
| ලද වට්ටම් | | 4,900 |
| ප්‍රචාරණ වියදම් | 9,250 | |
| බැංකු ශේෂය | 38,650 | |
| මුදල් ශේෂය | 25,700 | |
| ගැනිලි | 21,000 | |
| ප්‍රාග්ධන ගිණුම් | | |
| - රංග | | 100,000 |
| - ජීව | | 80,000 |
| - සුජීව | | 60,000 |
| ජංගම ගිණුම් | | |
| - රංග | | 18,800 |
| - ජීව | | 9,000 |
| - සුජීව | | 8,050 |
| ක්ෂය වෙන් කිරීම 2020/01/01/දිනට | | |
| - මෝටර් රථ | | 36,000 |
| - කාර්යාල උපකරණ | | 19,000 |
| - ගෘහ භාණ්ඩ | | 12,300 |

| | | |
|---|---|---|
| අඩමාන ණය වෙන් කිරීම් 2020/01/01 දිනට | | 1,500 |
| පොළී ලැබීම් | | 6,300 |
| | 832,600 | 832,600 |

අමතර තොරතුරු

I. රංග විශ්‍රාම යන අවස්ථාවේ දී ඔහුට මුදලින් රු.10,000 ක් ගෙවීමටත් ඔහු භාවිතා කරමින් සිටි පිරිවැය රු. 20 000 ක් හා එදිනට සමුච්චිත ක්ෂය රු.8,000 ක් වූ මෝටර් රථය රු.18,000 කට ඔහුට පවරන ලදි. රංගට ගෙවිය යුතු ඉතිරි මුදල ණය ගිණුමකට මාරු කිරීමට තීරණය කරන ලදි. ජීව සහ සුජීව 3:2 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය දිගටම කරගෙන යාමට තීරණය කරන ලදී.

II. තොගය 2020/12/31 දිනට රු. 20,000කි.

III. හවුල් කරුවන්ගේ ගැනිලි

| | රංග | ජීව | සුජීව |
|---|---|---|---|
| මුදල් | 8,000 | 7,000 | 6,000 |
| භාණ්ඩ | 10,000 | 8,000 | 6,000 |

භාණ්ඩ ගැනිලි පොත් වල වාර්තා කර නැත.

IV. බොල් ණය රු.2,500 ක් කපා හැරිය යුතුවේ. ඉතිරි ණය ගැතියන්ගෙන් රු.2,500 කි.

V. අඩමාන ණය වෙන් කළයුතුවේ.

VI. ස්ථාවර වත්කම් සියල්ල පිරිවැයට 10% ක් ක්ෂය කළ යුතු වේ.

VII. උපචිත විදුලිය රු. 2,800කි. මාසික ගොඩනැගිලි කුලී රු. 1,000 ක් වේ.

VIII. විශ්‍රාම ගැනීම වෙනුවෙන් කීර්තිනාමය රු. 40,000 කට අගය කර ඇත. එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපිය යුතුවේ.

අවශ්‍ය වන්නේ

1. 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා ලාභ අලාභ විසර්ජන ප්‍රකාශය
2. හවුල්කරුවන්ගේ ජංගම හා ප්‍රාග්ධන ගිණුම්
3. 2020/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

04) අශෝක සහ බිමල් 3:2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් ගිය හවුල් ව්‍යාපාරයට 2017/04/1 දින නාමල් ඇතුලත් කරගන්නා ලදී. 2017/04/01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| | හර (රු'000) | බැර(රු'000) |
|---|---:|---:|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ පිරියත උපකරණ | 6,000 | |
| - ක්ෂය වෙන් කිරීම් | (600) | 5,400 |
| ජංගම වත්කම් | | |
| තොගය | 400 | |
| වෙළඳ ලැබිය යුතුදේ | 1,200 | |
| මුදල් | 600 | 2,200 |
| මුලු වත්කම් | | **7,600** |
| හිමිකම් සහ වගකීම් | | |
| ප්‍රාග්ධන ගිණුම් | | |
| - අශෝක | 3,000 | |
| - බිමල් | 2,000 | 5,000 |
| ජංගම ගිණුම් | | |
| - අශෝක | 120 | |
| - බිමල් | 80 | 200 |
| ජංගම නොවන වගකීම් | | |
| අශෝක - ණය ශේෂය | | 1,000 |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ගෙවිය යුතු දේ | 1,050 | |
| උපචිත කුලී | 300 | |
| උපචිත පොලී - අශෝක | 50 | 1,400 |
| මුලු හිමිකම් සහ වගකීම් | | **7 600** |

අමතර තොරතුරු

I. නාමල් රු. 1,000,000 ප්‍රාග්ධනය ලෙස රැගෙන එන ලදි.

II. නාමල්ගේ ඇතුලත් වීමත් සමග පහත කරුණු වලට හවුල් කරුවන් එකඟ වී ඇත.

- සෑම හවුල්කරුවෙකුට ම රු. 5,000 ක මාසික වේතනයක් ගෙවීම.
- නව ලාභ අලාභ බෙදා ගැනීමේ අනුපාතය අශෝක , බිමල් සහ නාමල් අතර 2:2:1 වේ
- හවුල් කරුවන් විසින් ව්‍යාපාරයට සැපයූ ණය සඳහා පොළී අනුපාතය 10% කි.

III. කීර්ති නාමය රු.600,000 කට ඇස්තමේන්තු කර ඇති අතර එය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපිය යුතුය

IV. පහත ගනුදෙනු 2018/03/31 දිනෙන් අවසන් වසරට අදාල වේ.

| | (රු.000) |
|---|---:|
| අත්පිට විකුණුම් | 3,000 |
| ණයට විකුණුම් | 4,000 |

| | |
|---|---|
| ණයට ගැනුම් | 2,500 |
| ණය හිමියන්ට ගෙවීම | 2,200 |
| දේපළ පිරියත සහ උපකරණ ගැනුම් | 800 |
| කුලී ගෙවීම් | 700 |
| පොළී ගෙවීම් - අශෝක | 120 |
| මෙහෙයුම් වියදම් | 1,300 |
| මුදල් ගැනිලි - අශෝක | 80 |
| - බිමල් | 60 |
| වේතන ගෙවීම් - අශෝක | 50 |
| - බිමල් | 50 |
| - නාමල් | 50 |
| දේපළ පිරියත උපකරණ ක්ෂය | 620 |

V. 2018/03/31 දිනට තොගය 500,000 කි. වෙළඳ ලැබිය යුතු දේ 2018/03/31 දිනට රු. 600,000 කි. උපචිත කුලී 2018/03/31 දිනට රු.200,000 කි.

අවශ්‍ය වන්නේ

1) 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා ලාභ අලාභ විසර්ජන ප්‍රකාශය
2) හවුල්කරුවන්ගේ ජංගම හා ප්‍රාග්ධන ගිණුම්
3) 2018/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

05) දයාල් හා පියල් විසින් පවත්වා ගෙන යන නිෂ්පාදන හවුල් ව්‍යාපාරයේ 2022.03.31න් අවසන් වර්ෂය සඳහා පහත ශේෂ ලයිස්තුව ලබා දී ඇත.

| විස්තරය | හර (රු'000) | බැර (රු'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ශේෂ - දයාල් | | 2,000 |
| පියල් | | 800 |
| ජංගම ශේෂ - දයාල් | | 650 |
| පියල් | 150 | |
| 2021.04.01 දිනට - අමුද්‍රව්‍ය තොගය | 200 | |
| නිමි තොග | 150 | |
| නොනිමි තොග | 150 | |
| අමුද්‍රව්‍ය ගැණුම් | 2,500 | |
| ගෙන ඒමේ කුලී - අමුද්‍රව්‍ය | 75 | |
| ඍජු ශ්‍රමය | 250 | |
| විදුලිය | 600 | |
| වෙනත් පරිපාලන වියදම් | 220 | |
| කර්මාන්තශාලා ගොඩනැගිලි | 1,800 | |
| යන්ත්‍රෝපකරණ | 1,500 | |
| බෙදාහැරීමේ රථය | 1,500 | |
| 2021.04.01 දිනට සමුච්චිත ක්ෂය වෙ.කි. කර්මාන්තශාලා ගොඩනැගිලි | | 360 |
| යන්ත්‍රෝපකරණ | | 300 |
| බෙදාහැරීමේ රථ | | 200 |
| විකිණුම් | | 4,300 |
| ගැනිලි-දයාල් | 180 | |
| පියල් | 175 | |
| සේවක වේතන | 350 | |
| රාහුල් ගෙනා මුදල | | 1,000 |
| වරිපනම් හා රක්ෂණ | 40 | |
| ණය ගිණුම - පියල් | | 500 |
| මුදල් | 100 | |
| ණයගැති | 500 | |
| ණයහිමි | | 300 |
| | 10,410 | 10,410 |

2021.04.01 දින ව්‍යාපාරයේ ප්‍රධාන නිෂ්පාදන විධායක ලෙස කටයුතු කළ රාහුල් හවුල් ව්‍යාපාරයට බඳවා ගන්නා ලද අතර එතැන් සිට හවුල් ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. එම ගිවිසුම මෙසේය.

- ★ දයාල්, පියල් හා රාහුල් අතර පිළිවෙළින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීම.
- ★ ගළපන ලද ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂිකව 10%ක පොලියක් වෙන් කිරීම.
- ★ දයාල් හා පියල්ට මාසිකව රු.40,000ක හවුල් වැටුප් ලබා දීමටද, රාහුල් තවදුරටත් නිෂ්පාදන විධායක ලෙස මාසික රු.50,000ක වැටුපක් ලබා දීමටද තීරණය විය.

රාහුල් බඳවා ගැනීමේදී ඔහු ප්‍රාග්ධනය ලෙස රු.1,000,000ක් යෙද වූ අතර, එදිනට කීර්තිනාමය රු.1,200,000ක් ලෙස තක්සේරු කර එය ප්‍රාග්ධන ගිණුම මඟින් ගැළපීමට තීරණය විය.

අතිරේක තොරතුරු

I. 2022.03.31 දිනට අවසාන තොග පිරිවැය මෙසේය.
   - අමුද්‍රව්‍ය 100,000
   - නිමි ද්‍රව්‍ය 25,000
   - නොනිමි 80,000

   අවසාන නිමි තොග ඒකකයක පිරිවැය රු.100ක් වූ අතර මින් තොග ඒකක 50ක් රු.80 බැගින් විකිණීමට සිදුවන බවට තක්සේරු කර ඇත.

II. හවුල්කරුවන් විසින් පහත පරිදි නිමි භාණ්ඩ තොග වෙළඳ ප්‍රදර්ශනාගාරයෙන් සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇත.
   - දයාල් 25,000
   - පියල් 10,000
   - රාහුල් 15,000

III. වර්ෂය තුළ රාහුල්ට මාස 03ක වැටුප මුදලින් ගෙවා ඇති අතර, එය වැටුප් හා වේතන තුළ ඇතුළත් වේ.

IV. විදුලිය හා වරිපනම් රක්ෂණ වලින් 60% බැගින් නිෂ්පාදන කටයුතු වලට වෙන් කළ යුතුය.

V. දේපළ පිරියත උපකරණ පහත පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
   - කර්මාන්තශාලා ගොඩනැගිල්ල 10%
   - යන්ත්‍රෝපකරණ 20%
   - බෙදාහැරීම් රථ 5%

VI. ශේෂ පිරික්සුමේ දක්වා ඇති පියල් සැපයූ ණය මුදල 2021.10.01 දින ලබා දෙන ලදී. මේ සඳහා පොලී ගැළපිය යුතුය.

අවශ්‍ය වන්නේ,

1. 2022.03.31න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ නිෂ්පාදන ආදායම් ප්‍රකාශය (විසර්ජනයන්ද සහිතව)
2. 2022.03.31 දිනට ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම

06) රන්, තරු හා සඳ විසින් පවත්වා ගෙන යන හවුල් ව්‍යාපාරයේ 2022.03.31න් අවසන් වර්ෂයට අදාළ ජංගම ගිණුම මෙසේය.

ජංගම ගිණුම

| | රන් | තරු | සඳ | | රන් | තරු | සඳ |
|---|---|---|---|---|---|---|---|
| ගෙවූ වේතන | 80 | 60 | - | ශේෂය | 50 | 120 | 70 |
| | 10 | | | ප්‍රාග්ධන පොලී | 150 | 100 | 100 |
| ගෙවූ පොලී | | | | හවුල් වේතන | 120 | 120 | - |
| | | | | කොමිස් ආදායම් | | | 30 |
| | | | | ගොඩනැගිලි කුලී | - | 60 | - |
| | | | | ණය පොලී | 30 | - | - |
| ශේෂය ප/ගෙ | 710 | 640 | 350 | ලාභ කොටස් | 450 | 300 | 150 |
| | 800 | 700 | 350 | | 800 | 700 | 350 |

2022.03.31න් අවසන් වර්ෂයට අදාළව ලාභය විසර්ජනය කර ඇතත් ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත වැරදි හා මඟහැරීම් සිදු වී ඇත.

I. රන් හා තරු විසින් සිදු කළ භාණ්ඩ ගැනිලි පිළිවෙළින් 100,000ක් හා 120,000ක් ගිණුම්ගත වී නොමැත.
II. මෙම ආයතනය සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 8%ක්ද සේව්‍යයාගෙන් 12%ක්ද වෙන් කරනු ලබන අතර, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3%ක් ගලපනු ලබයි. ශුද්ධ ලාභය ගණනය කිරීමේදී සේවකයින්ට මුදලින් ගෙවූ රු.460,000ක් පමණක් ගළපා ඇති අතර, එකී මුදල ගණනය කිරීමේදී සේවක අර්ථසාධක සේවක ගැලපීම පමණක් අඩු කර ඇත.
III. රු.35,000ක ගැණුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟහැරී ඇත.
IV. හවුල් ව්‍යාපාරයේ වරිපනම් ගාස්තු වලින් රු.40,000ක් රන් විසින් පෞද්ගලිකව ගෙවා ඇති අතර ඒ සම්බන්ධව කිසිදු සටහනක් පොත් වල තබා නැත.
V. හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලැබුවේ තරු ට අයිති ගොඩනැගිල්ලක මාසිකව රු.10,000ක කුලියකටය. නමුත් 2021.10.01 දින ව්‍යාපාර පරිශ්‍රය රු.15,000ක මාසික කුලියකට වෙනත් ස්ථානයකට රැගෙන යන ලදී. ඒ සඳහා වසරක කුලිය එකවර ගෙවා මුලු මුදලම ගෙවල් කුලී ගිණුමට මාරු කර ඇත.

★ 2022.03.31 දින තරු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගිය අතර, ඔහුට ගෙවිය යුතු මුළු මුදලට 10%ක මාසික පොළියක් හිමි ණය ගිණුමකට මාරු කිරීමට එකඟ විය. තවද 'තරු' විශ්‍රාම යන දින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය 600,000කට තක්සේරු කර ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීමටත් එතැන් සිට රන් හා සඳ හවුල් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමට එකඟ විය.

පෙර හවුල් ගිවිසුමේ පැවති ලාභ බෙදා ගැනීමේ අනුපාතය 2:1 අනුපාතයට රන් හා සඳ අතර වෙනස් කිරීම හැර වෙනත් කිසිදු වෙනසක් සිදු නොකිරීමට එකඟ විය.

අවශ්‍ය වන්නේ,

2022.03.31න් අවසන් වර්ෂය සඳහා

1. ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ලේඛනය
2. විසර්ජන ගිණුම
3. ජංගම ගිණුම
4. ප්‍රාග්ධන ගිණුම

# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 10 හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ ප්‍රශ්න

01) නිවැරදි පිළිතුර තෝරන්න.
හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 20 ක් බවට සීමා කර ඇත්තේ,
(1) 1890 හවුල් ආඥා පනත මගිනි.
(2) 2007 අංක 7 දරන සමාගම් පනත මගිනි.
(3) 1840 අංක 7 දරන වංචා වැලැක්වීමේ ආඥා පනත මගිනි.
(4) 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත මගිනි.
(5) එම හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම මගිනි.

02) පහත ප්‍රකාශ අතුරින් හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව අසත්‍ය ප්‍රකාශය වනුයේ,
(1) හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට සැපයූ ණය සඳහා 5%ක පොළියක් හිමි වේ.
(2) පාලන කටයුතු සිදු කිරීම වෙනුවෙන් හවුල්කරුවන් සඳහා වේතන හිමි නොවේ.
(3) හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට යෙදවූ ප්‍රාග්ධනය සඳහා ප්‍රාග්ධන පොළී හිමි වේ.
(4) ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවකු විසින් පුද්ගලිකව දරා ඇති විට එය ප්‍රතිපූරණය කළ හැකිය.
(5) හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ හවුල්කරුවන් විසින් සමව බෙදා ගත යුතුය.

03) විසල් හා නිසල් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන අතර ලාභ අලාභ 5:3 අනුපාතයට බෙදා ගනී. ඔවුන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ 2021.04.01 දිනට පහත පරිදි වේ.

| විස්තරය | විසල් (රු'000) | නිසල් (රු'000) |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 500 | 300 |
| ජංගම ගිණුම් | 50 | 80 |

සියලු හවුල්කරුවන්ට 10% ක ප්‍රාග්ධන පොළී හා රු.30,000ක මාසික වේතනයක් හිමි වේ. වාර්තා කරන ලද හවුල්කරුවන්ගේ ගැනිලි විසල් රු.20,000ක් හා නිසල් රු.30,000ක් වේ.

2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනයන්ට පෙර ලාභය රු.2,800,000 ක් වේ.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

2022/03/31 දිනට විසල්ගේ හා නිසල්ගේ ජංගම ගිණුම් ශේෂ වනුයේ, (රු. 000)

(1) විසල් - 1,380, නිසල් - 890
(2) විසල් - 1,730, නිසල් - 1,250
(3) විසල් - 1,710, නිසල් - 1,220
(4) විසල් - 1,690, නිසල් - 1,190
(5) විසල් - 1,250, නිසල් - 750

ප්‍රශ්න අංක 4,5,6 සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

අනුර, රෝහණ සහ වෙනුර හවුල් ව්‍යාපාරයේ 2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම ගිණුම පහත දැක්වේ.

රු'000

| විස්තරය | අනුර | රෝහණ | වෙනුර | විස්තරය | අනුර | රෝහණ | වෙනුර |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | | | 10 | ශේෂය ඉ/ගෙ | 20 | 40 | |
| ගැනිලි | 100 | 150 | 90 | ප්‍රාග්ධන පොළී | 40 | 60 | 40 |
| | | | | වේතන | 480 | 480 | 480 |
| ශේෂය ප/ගෙ | 700 | 586 | 472 | ලාභ කොටස් | 260 | 156 | 52 |
| | 800 | 736 | 572 | | 800 | 736 | 572 |
| | | | | ශේෂය ඉ/ගෙ | 700 | 586 | 472 |

අමතර තොරතුරු

හවුල් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේදී අනුර සහ රෝහණ විසින් ලබා ගන්නා ලද රු.20,000ක හා රු.40,000ක භාණ්ඩ ගැනිලි වාර්තා වී නැත.
හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන පොළී 10% කි.

4) හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය ගණනය කරන්න.

5) හවුල් ව්‍යාපාරයේ මුලු හිමිකම ගණනය කරන්න.

6) 2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුරගේ මුලු ඉපයීම කීයද?